සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,707 - 2011 මැයි මස 20 වැනි සිකුරාදා - 2011.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 932 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 934 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මැයි මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 මැයි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තනතුරු - ඇබෑර්තු

## දොම්පෙ ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "ලේකම්, දොම්පෙ ප්‍රාදේශීය සභාව කිරිඳිවැල" යන ලිපිනයට 2011.06.06 වැනි දිනට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | | අවම සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | ආදායම් පරිපාලක II ශ්‍රේණිය | 01 | රු. 13,120 - 10 x 145 - 11 x 170-10 240-10 x 320 - රු. 22,040 ( MN-1-2006/A) (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | (අ) | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් සාමාර්ථය ලබා තිබීම හා බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතනයක වසර 05 ක සේවා කාලයක් සහිත ස්ථිර තනතුරක් දරන්නකු වීම ; හෝ |
| | | | | (ආ) | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම. |
| 02 | පෙර පාසැල් සහායක | 01 | රු. 11,730-10x120-10x130-10 x 145-12x160-රු. 17,600 PL-1-2006/A) (රු. 13,060) ආරම්භක වැටුප් පියවර වේ. හත්වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | (අ) | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක්වරකදී කවර හෝ විෂයන් 6ක් සමත් වීම. |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ආදායම් පරිපාලක තනතුර සඳහා බඳවාගනු ලබන්නේ රා.ප.ච. අංක 15 /90 ප්‍රකාර ලිඛිත පරීක්ෂණයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය ;
(ii) පෙර පාසැල් සහායක තනතුර සඳහා බඳවාගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය;
(iii) ලිඛිත පරීක්ෂණයක සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 01ක ප්‍රශ්න පත්‍රයකින් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කරන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

1. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය ;
(ii) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්කිරීමට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය;
(iii) බස්නාහිර පළාත් සභාවේ දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ;
(iv) 2011.06.06 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය; (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවා නියුක්තිකයන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.)
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවකු නොවිය යුතු ය;
(vi) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය;
(vii) දැනට සේවයේ නියුක්ත අය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය;
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසි වලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝග හා චක්‍රලේඛ වලටද බස්නාහිර පළාත් සභාව හෝ දොම්පෙ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට තෝරාගනු ලබන සේවකයින් බැඳී සිටිය යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලිපිවල පිටපත් ද අමුණා එවිය යුතු ය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්, එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගෙන් ලබාගත් එකක් විය යුතුය.;
5. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
6. වෘත්තීය/පළපුරුද්ද පිළිබඳ සහතික.

අවශ්‍යතාවයක් මතුවුවහොත් මෙම තනතුරුවලට බඳවා ගැනීම අවලංගු කිරීමේ අයිතිය දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

ආර්. පී. සිරිමාන්න,
ලේකම්,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2011 ක් වූ මැයි මස 04 වැනි දින,
කිරිඳිවැල,
දොම්පෙ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***දොම්පෙ ප්‍රාදේශීය සභාව - කිරිඳිවැල***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ......................................................... තනතුර සඳහා බඳවා ගැනීම*

01. මුලකුරු සමග නම :——————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
03. ස්ථිර ලිපිනය :——————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————.
06. උපන් දිනය:
අවුරුද්ද :——————., මාසය:——————., දිනය:——————.
07. 2011.06.06 දිනට වයස :
අවුරුදු : ——————. මාස :——————. දින:——————.
08. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? :——————.
09. අධ්‍යාපන සුදුසුකම් :- (සමත්වූ විභාග පිළිබඳ විස්තර) :——————.
10. වෘත්තීය සුදුසුකම්: (සහතික මගින් සනාථ කළ යුතුයි.) : ——————.
11. සේවා පළපුරුද්ද : ——————.
12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? : ——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසුව ඒ බව හෙළි වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය මොනම ආකාරයෙන් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද, මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

නම : ——————.
පදවි නාමය : ——————.
දෙපාර්තමේන්තුව/ආයතනය : ——————.
(නිල මුද්‍රාව යොදන්න)

05-466

**නිවැරදි කිරීමයි**

**ගම්පොල නගර සභාව**

2011.01.07 වැනි දින අංක 1,688 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ තනතුරු - ඇබෑර්තු යටතේ පළ වූ ගම්පොල නගර සභාවේ ජී - 147 දැන්වීමෙහි "අයදුම්පත් 2011.01.31 වැනි දින "ට යන්න" අයදුම්පත් 2011.06.15 වැනි දින" යනුවෙන් නිවැරදි විය යුතු ය.

අයි. එම්. එස්. කේ. එම්. ඉදිසූරිය,
ලේකම්,
ගම්පොල නගර සභාව.

05-374

---

# පළාත් පාලන නිවේදන

**අරණායක ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24 (2) වැනි වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර, සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. දිනේෂ් ගුණරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව අරණායක.

2011 මැයි මස 02 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*මාර්ගයේ නම* : අම්බලකන්ද කඩමණ්ඩිය සිට උඩකොටුව දක්වා මාර්ගය
*මාර්ගයේ ආරම්භය හා අවසානය* : අම්බලකන්ද කඩමණ්ඩිය සිට උඩකොටුව දක්වා මාර්ගය
*මාර්ගයේ දිග* : මීටර් 175 *පළල* : අඩි 06
*ග්‍රාම නිලධාරී වසම* : අංක 43/ඒ, අම්බලකන්ද

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 1. ලලිත් දිසානායක මයා | ගමගෙදර වත්ත |
| 2. ලීලා වික්‍රමසිංහ මිය | එගොඩවත්ත |
| 3. ඩබ්. විමලදාස මයා | එගොඩදෙනිය |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | |
|---|---|
| 1. ලලිත් දිසානායක මයා | ගමගෙදරවත්ත |
| 2. නන්දනී වික්‍රමසිංහ මිය | එගොඩදෙනිය කුඹුර |
| 3. ඩබ්. විමලදාස මයා | එගොඩදෙනිය |
| 4. එච්. ජී. සෝමපාල මයා | එගොඩදෙනිය |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2010.09.18 දිනැති අංක 6655 දරන පිඹුරුපත පරිදි ය.

*මාර්ගයේ නම* : ගැවිලිපිටිය දෙබත්ගම ප්‍රධාන මාර්ගයේ සිට ගෙදරවත්ත දක්වා මාර්ගය
*මාර්ගයේ ආරම්භය හා අවසානය* : ගැවිලිපිටිය දෙබත්ගම මාර්ගයේ පිටකොටුව අසලින් ආරම්භව ගෙදරවත්ත ඉඩම දක්වා
*මාර්ගයේ දිග* : මීටර් 190 *පළල* : අඩි 08
*ග්‍රාම නිලධාරී වසම* : දෙබත්ගම උඩබාගේ අංක 47/බී

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | | |
|---|---|---|
| 1. | එල්. රත්නවතී මිය | හිටිනාගෙදරවත්ත |
| | කේ. ජී. ජයතිලක මයා | එම |
| | කේ. ජී. රූපසිංහ මයා | එම |
| | ආර්. පී. නිමල්තිස්ස මයා | එම |
| 2. | එම්. ආර්. අජිත් සමන්තිලක මයා | සොමියාවත්ත |
| 3. | එම්. ආර්. ජේ. පුෂ්පකුමාර මයා | සොමියාවත්ත |
| 4. | එම්. ප්‍රියන්ත මාරසිංහ මයා | ගෙදරවත්ත |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | | |
|---|---|---|
| 1. | කේ. ජී. ජයතිලක මයා | හිටිනාගෙදරවත්ත |
| 2. | කේ. මාරසිංහ මයා | කරත්තගෙයිකොටුව |
| 3. | ආර්. ඒ. නිමල් රත්නායක මයා | සොමියාවත්ත |
| 4. | එම්. ආර්. අජිත් සමන්තිලක මයා | සොමියාවත්ත |
| 5. | කේ. මාරසිංහ මයා | ගෙදරවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2010.04.04 දිනැති අංක 6652 දරන පිඹුරුපත පරිදිය.

05-443

---

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1)(අ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අගලවත්ත ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් අගලවත්ත ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එච්. පී. සුමනසේකර,
විශේෂ කොමසාරිස්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2011 අප්‍රේල් මස 27 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### මාර්ග ලේඛනය

*අගලවත්ත ප්‍රාදේශීය සභාව*

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග කි. මී.* | *පළල මීටර්* |
|---|---|---|---|
| 01 | ලිලිනාවත්ත මාර්ගයෙන් ආරම්භ වී කළුපහන මතුගම මාර්ගයෙන් අවසන්වන කුඹුරු මැදින් ගමන් ගන්නා ලිලිනාවත්ත මාර්ගය | 0.426 | 3.65 |

| අනු. අංකය | මාර්ගයේ නම | දිග කි. මී. | පළල මීටර් |
|---|---|---|---|
| 02 | දාපිලිගොඩ කැකුලන්දල මාර්ගයෙන් ආරම්භවන බර්ටි ගුණවර්ධන මහතාගේ නිවස අසලින් අවසන්වන මොන්ටිසිනාවත්ත පාර | 0.191 | 3.65 |
| 03 | අඹේමුල්ල මාර්ගයෙන් ආරම්භ වී ශාන්ත මහතාගේ නිවස අසලින් අවසන් වන දෙකන්දෙනිය පාර | 0.235 | 3.05 |
| 04 | යටියන මානානවත්ත මාර්ගයෙන් ආරම්භ වී සිරිපාල මහතාගේ නිවස අසලින් අවසන් වන කහටගහවත්ත පිටකට්ටිය පාර | 0.075 | 3.05 |
| 05 | ඩාර්ටන්ෆීල්ඩ් මාර්ගයෙන් ආරම්භ වී කඹුරුගොඩවත්ත මාර්ගය අසළ බෝධිය ළඟින් අවසන් වන පුවක්වත්ත පළමු පටුමග පාර | 0.3 | 4.87 |
| 06 | අගලවත්ත මතුගම මාර්ගයෙන් ආරම්භ වී බෝපිටිය ස්ටෝර්ස් අසලින් ගමන් ගන්නා බෝක්කුව අසලින් අවසන් වන කඩේවත්ත මාර්ගය | 0.2 | 4.57 |
| 07 | අඹේමුල්ල මාර්ගයෙන් ආරම්භ වී සන්ධ්‍යා කුමාරි මහත්මියගේ නිවස අසලින් අවසන් වන පළමු පටුමග | 0.14 | 3.65 |
| 08 | අඹේමුල්ල මාර්ගයෙන් ආරම්භ වී ගල්පොත්ත අසලින් අවසන් වන දෙවන පටුමග | 0.14 | 4.57 |
| 09 | අඹේමුල්ල මාර්ගයෙන් ආරම්භ වී කේ. ඩී සුනිල් මහතාගේ නිවස අසලින් අවසන් වන තුන්වන පටුමග | 0.05 | 4.57 |
| 10 | අගලවත්ත මතුගම මාර්ගයෙන් ආරම්භ වී තිලානි කුඹලාතර මහත්මියගේ නිවස අසලින් අවසන් වන මැණික්වත්ත මාර්ගය | 0.075 | 3.65 |
| 11 | දාපිලිගොඩ විහාරගම මාර්ගයෙන් ආරම්භ වී දාපිලිගොඩ විහාරගම මාර්ගයෙන් අවසන්වන දාපිලිගොඩ පන්සල මාර්ගය | 0.5 | 4.57 |
| 12 | මුලටියන ඩාර්ටන්ෆීල්ඩ් පාරෙන් ආරම්භ වී දෙල්ගහවත්ත මහ ඉඩමෙන් අවසන්වන දෙල්ගහවත්ත මාර්ගය | 0.125 | 3.05 |
| 13 | මුලටියන බෝධියකන්ද මාර්ගයෙන් ආරම්භ වී කපිල මහතාගේ නිවස අසලින් අවසන් වන ගහලවත්තහේන මාර්ගය | 0.75 | 3.05 |
| 14 | මතුගම අගලවත්ත ප්‍රධාන මාර්ගයෙන් ආරම්භවන ගුණසේකර මාවතෙන් අවසන්වන ග්‍රීන් පාර්ක් 11 වැනි අදියර පළමු පටුමග | 0.487 | 4.87 |
| 15 | ග්‍රීන් පාර්ක් දෙවන අදියර පළමු පටුමගින් ආරම්භ වන ළිඳ අසලින් අවසන්වන දෙවන පටුමග | 0.12 | 3.65 |
| 16 | උඩවෙල කණ්ඩගල මාර්ගයේ කෙළවරින් ආරම්භවන සෝමපාල මල්ලවආරච්චි මහතාගේ නිවස අසලින් අවසන්වන උඩවෙල කණ්ඩගල මාර්ගයේ කෙළවරින් කන්ද පැත්තට ඇති අතුරු මාර්ගය | 0.215 | 3.65 |
| 17 | අගලවත්ත කුඩලිගම මාර්ගයේ අඹගස්හන්දියෙන් ආරම්භ වී හැවුලොක්වත්තෙන් අවසන්වන ගිරිකොල මඩවලතැන්න පාර | 1.276 | 3.65 |
| 18 | හල්ඕවිට මාර්ගයෙන් ආරම්භ වන සෝමසිරි මහතාගේ නිවස අසලින් අවසන්වන රනබාහුලකන්ද පාර | 0.452 | 3.65 |
| 19 | හල්ඕවිට මාර්ගයෙන් ආරම්භවන ඩැනී මහතාගේ ඉඩමෙන් අවසන් වන පුංචි කන්ද පාර | 0.584 | 4.87 |
| 20 | හල්ඕවිට මාර්ගයෙන් ආරම්භවන කදිරවත්ත හන්දියෙන් අවසන් වන කොන්ඩිගල අරාව මාර්ගය | 0.622 | 3.65 |
| 21 | අගලවත්ත - මතුගම ප්‍රධාන මාර්ගයෙන් ආරම්භවන දෙබරහේන ගමෙන් අවසන්වන යටියන සෝදාපාළුව මාර්ගය | 0.375 | 4.87 |
| 22 | පොල්ගම්පල - අගලවත්ත ප්‍රධාන මාර්ගයෙන් ආරම්භවන කුරුපිට මාර්ගයෙන් අවසන්වන දියපත්තුගම දිව්‍යලෝක විහාර පාර | 2.1 | 4.87 |

05-517

---

**ගොඩකවෙල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය යටතේ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටියා වූ දැනට රක්වාන හා ගොඩකවෙල ප්‍රදේශයන්හි ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ වලට අමතරව පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශ ද 134(1) වගන්තිය යටතේ දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට සබරගමුව පළාතේ පලාත් පාලන සහකාර කොමසාරිස් විසින් අනුමත කර ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

*රක්වාන ප්‍රදේශයේ නව වරිපනම් සීමා*

*මායිම්*

*උතුර* :- පොතුපිටිය රක්වාන ප්‍රධාන මාර්ගයේ සහ අත්කම් නිවාස මාර්ගය හමුවන මාර්ග මධ්‍ය ලක්ෂයේ සිට වම් පසට දුර මීටර් 50ක් ද, එම රේඛාව ඔස්සේ ගංගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ 5 වැනි බෝක්කුව දක්වා මාර්ගයේ දෙපසට මීටර් 50ක් බැගින් ද, නැවත

පොතුපිටිය මාර්ගය මධ්‍ය රේඛාව ඔස්සේ බණ්ඩාරනායක මාවතේ මධ්‍ය රේඛාව දක්වා වම් පසට මීටර් 50ක් ද, බණ්ඩාරනායක මාවතේ මධ්‍ය රේඛාවට සමාන්තරව පහළ කොට්ටල මාර්ගයේ පාර හා පොල් කැල්ල පාර හමුවන ලක්ෂ්‍යය දක්වා වම් පසට මීටර්50ක් ද, පොල් කැල්ල මාර්ගය මධ්‍ය රේඛාව ඔස්සේ රක්වාන රත්නපුර ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා වම් පසට මීටර් 50ක් ද, රත්නපුර රක්වාන පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ රක්වාන වට රවුම අසලින් ඩෙල්වින් ඒ මාර්ගය මධ්‍ය ලක්ෂ්‍යය දක්වා මීටර් 50ක් වම් පසට ද ඩෙල්වින් "ඒ" හරහා මස්ඉඹුල ගොඩකවෙල දක්වා මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගොඩකවෙල මාර්ගය මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද,

*නැගෙනහිර* :- එම මාර්ගය මධ්‍ය රේඛාව ඔස්සේ බටලන්ද මාර්ගය හමුවන හන්දිය මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද, බටලන්ද මාර්ගය මධ්‍ය රේඛාව ඔස්සේ වැඩිහිටි නිවාසය අසලින් කන්දකුඹුර පාර හමුවන හන්දියේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද, එම ලක්ෂයේ සිට කන්දකුඹුර මාර්ගය මධ්‍ය රේඛාව ඔස්සේ උඩහවිදිය හරහා කන්දකුඹුර මාර්ගය හමුවන හන්දියේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා මාර්ගය මධ්‍ය රේඛාවට සමාන්තරව වම්පසට මීටර් 50ක් ද, එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ මිහිඳු මාවතේ මධ්‍ය ලක්ෂ්‍යය හරහා ඇති රේඛාවට සමාන්තරව වම්පසට මීටර් 50ක් ද,

*දකුණට* :- මිහිඳු මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ දෙනියාය මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍ය දක්වා වම් පසට මීටර් 50ක් ද, දෙනියාය රක්වාන මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව වම් පසට මීටර් 50ක් ද, මැදගංගොඩ මාර්ගය හමුවන හන්දිය දක්වා ද,

*බස්නාහිර* :- එම හන්දියේ සිට දෙනියාය රක්වාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අත්කම් නිවාස පාර හන්දියේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වාත්, වම් පසට මීටර් 50ක් ද අත්කම් නිවාස මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ පොතුපිටිය මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා වම්පසට මීටර් 50ක් ද, උතුරු දෙසින් ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වටවන සියළු ප්‍රදේශ,

*ගොඩකවෙල ප්‍රදේශයේ නව වරිපනම් සීමා*

*උතුර* :- මාදම්පේ හම්බන්තොට ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට රිදීවිට ඇමටියගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව මීටර් 100 ලක්ෂ්‍යයේ සිට මාදම්පේ හම්බන්තොට ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව මල්වත්ත කෝම්පිටිය පටුමගේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ඇති රේඛාව ඔස්සේ ද, කෝම්පිටිය පටුමගේ මධ්‍ය රේඛාවට සමාන්තරව ගොඩකවෙල කෝම්පිටිය මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා වම්පසට මීටර් 50 රේඛාව ඔස්සේ ද, කෝම්පිටිය ගොඩකවෙල මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව වේරහැර මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා වම් පසට මීටර් 50ක් දුරින් පිහිටි රේඛාව ඔස්සේ ද, වේරහැර මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව වම්පසට මීටර් 50ක් දුරන් පිහිටි රේඛාව සහ සිද්ධවත්ත මාර්ගයේ මධ්‍ය රේඛාවට මීටර් 50ක් දුරින් වම්පසට පිහිටි රේඛා දෙක හමුවන ලක්ෂ්‍ය දක්වා ද, සිද්ධවත්ත මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව වම් පසට මීටර් 50ක් දුරින් පිහිටි රේඛාව ඔස්සේ වරායාය මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද, පොල පිටුපස මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව වම්පසට මීටර් 50ක් දුරින් පිහිටි රේඛාව ඔස්සේ මාදම්පේ හම්බන්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද, එම මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව මීටර් 100ක් දුරින් වම් පස පිහිටි රේඛාව ඔස්සේ වලකඩ ඇළ දක්වා ද,

*නැගෙනහිර* :- මාදම්පේ හම්බන්තොට මාර්ගයේ කොස්නාතොට වලකඩ බෝක්කුවේ මධ්‍ය ලක්ෂයේ සිට වම් පසට මීටර් 100ක් සහ දකුණු පසට මීටර් 100 දුරින් පිහිටි ලක්ෂ්‍ය දක්වා ද,

*දකුණ* :- ඉහත වලකඩ බෝක්කුවේ දකුණු පස මීටර් 100 දුරින් පිහිටි ලක්ෂයේ සිට මාදම්පේ හම්බන්තොට මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව දකුණු පසට මීටර් 100ක් දුරින් පිහිටි රේඛාව ඔස්සේ රිදීවිට ඇමටියගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව මාදම්පේ හම්බන්තොට මාර්ගයේ දකුණු පසට දික්කළ රේඛාවේ මීටර් 100ක් දුරින් පිහිටි ලක්ෂ්‍යය දක්වා ද,

*බස්නාහිර* :- මාදම්පේ හම්බන්තොට මාර්ගයේ රිදීවිට හංදියේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට වම් පසට මීටර් 100 සහ දකුණු පසට මීටර් 100 දුරින් පිහිටි ලක්ෂ දක්වා ද, ඇතුලු වන සියළු ප්‍රදේශ.

වී. ජී. එස්. මංගලතිස්ස,
සභාපති,
ගොඩකවෙල ප්‍රාදේශීය සභාව.

05-516

---

**වත්තල ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (272) අධිකාරය

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය 2011 වර්ෂය තුළදී එළහරක් මස්, ඌරු මස්, එළුමස්, විකිණීම සඳහා ඉල්ලුම් කර ඇත. ඒ අනුව 2011 වර්ෂය තුළදී මස් විකිණීමේ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව විරුද්ධ වන ඕනෑම අයෙකු වේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දාහතරක් (14) ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මාවෙත ඉදිරිපත් කරන ලෙස ගෝඝාතක ආඥාපනත (272) අධිකාරිය 7(2) දරන වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ත්‍යාගරත්න අල්විස්,
සභාපති,
වත්තල ප්‍රාදේශීය සභාව.

2011 අප්‍රේල් 27 දින,
වත්තල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | *ඉල්ලුම්කරුගේ නම/ ලිපිනය* | *වෙළඳාමේ ස්වභාවය* | *වෙළඳාම කරන ස්ථානය* |
|---|---|---|---|
| 01. | ඩබ්. බුද්ධික සමන්ත<br>අංක 43, හේකිත්ත පාර,<br>වත්තල. | එළ හරක් මස් විකිණීම | අංක 39, හේකිත්ත හන්දිය,<br>හේකිත්ත පාර, වත්තල |
| 02. | මොහොමඩ් යුනුස්<br>අංක 228/8, බතලපිල්ලෑව,<br>මත්තුමගල, රාගම | එළු මස් විකිණීම | අංක 780, මීගමු පාර,<br>මත්තුමගල,<br>රාගම. |
| 03. | ජේ. ඩී. ජූඩ් වැග්නර්<br>අංක 380/ඩී, ඇටෝරාව,<br>උස්වැටකෙයියාව. | එළ හරක් මස් විකිණීම | අංක 148, රා තැබෑරුම අසල<br>උස්වැටකෙයියාව. |
| 04. | මොහිදීන් සේගුඩාවුඩ්<br>අංක 25/46, රාජසිංහ පාර,<br>මාබෝල, වත්තල. | එළු මස් විකිණීම | මීගමුව බස් නැවතුම අසල<br>මහබාගේ හන්දිය,<br>මීගමුපාර, රාගම. |
| 05. | ආර්. ඒ. සුනිල් අල්විස්<br>අංක 23/5, පල්ලිය පාර,<br>හේකිත්තවත්ත | ඌරු මස් කඩය | හේකිත්ත වේල්ල,<br>බන්ටි පාර අසල,<br>ඌරු මස් කඩය |
| 06. | එන්. ටී. ලෙස්ලි මෙන්ඩිස්,<br>අංක 220, කෝපියාවත්ත,<br>රාගම. | ඌරු මස් කඩය | ඇලපිටිවල පිහිටි<br>ඌරුමස් කඩය |
| 07. | එන්. ටී. ලෙස්ලි මෙන්ඩිස්,<br>අංක 220, කෝපියාවත්ත<br>රාගම. | එළ හරක් මස් කඩය | රාගම පාර,<br>ඇලපිටිවල පිහිටි<br>එළහරක් මස් කඩය |

05-483

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.